කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
Ministry of Labour and Foreign Employment

හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No.

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 11 .09.2024

## 2016 අංක 03 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය පිළිබඳ මාධ්‍ය නිවේදනය

2016 අංක 03 දරන ජාතික අවම වේතනය පනත හඳුන්වා දීම මඟින් පෞද්ගලික අංශයේ සේවය කරන සියළුම සේවකයින් සඳහා 2016.01.01 දින සිට බලාත්මක වන ආකාරයට ජාතික අවම වේතනයක් නියම කිරීමට කටයුතු කර ඇත. මෙම පනත මඟින් මාසික වැටුප් ගෙවන සේවකයන් සඳහා රුපියල් 10,000ක අවම වේතනයක් ද දෛනික වැටුප් ගෙවන සේවයන්ට රුපියල් 400ක දෛනික අවම වේතනයක් ගෙවීමට ද මුල් අවස්ථාවේ දී නියම කරන ලදී. නැවත 2021 වර්ෂයේ දී මෙම පනතට ගෙනෙන ලද සංශෝධනයක් මඟින් අවම මාසික වේතනය රුපියල් 12,500 දක්වා ද දෛනික වේතනය රුපියල් 500 දක්වා ද 2021 අගෝස්තු මාසයේ සිට ඉහළ නැංවීමට කටයුතු කරන ලදී. මෑත කාලීනව රටේ ඇතිවූ ආර්ථික අර්බුදයත් සමඟ ජීවන වියදම ඉහළ යාමට සාපේක්ෂව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමක් 2021 වර්ෂයේ සිට සිදු නොවීම නිසා අවස්ථා කිහිපයක දී ජාතික කම්කරු උපදේශන සභාවේ දී සාකච්ඡා කිරීමෙන් පසු ජාතික අවම වේතනය රුපියල් 12,500 සිට රුපියල් 17,500 දක්වා රුපියල් 5,000කින් ද, දෛනික අවම වේතනය රුපියල් 500 සිට 700 දක්වා ද රුපියල් 200කින් ද ඉහළ නැංවීමේ අරමුණින් ජාතික අවම වේතන පනත සංශෝධනය කිරීමට කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව, අදාළ පියවර අනුගමනය කිරීමෙන් අනතුරුව මෙම සංශෝධන කෙටුම්පත 2024.09.03 වන දින පර්ලිමේන්තුව විසින් සම්මත කිරීමට කටයුතු කළ අතර, ගරු කථානායකවරයා විසින් එකී කෙටුම්පතට අත්සන් කිරීමෙන් පසු මෙම මාසයේ සිට ක්‍රියාත්මක වීමට නියමිතව ඇත.

මේ අනුව, පෞද්ගලික අංශයේ සේවායෝජකයින් තම සේවකයින් සඳහා 2024 සැප්තැම්බර් මාසයේ සිට ජාතික මාසික අවම වේතනය වශයෙන් රුපියල් 17,500ක් සමඟ 2005 අංක 36 හා 2016 අංක 04 දරන අයවැය සහන දීමනා පනත් මඟින් ගෙවිය යුතු රුපියල් 3,500ක අයවැය සහන දීමනා ද ඇතුළුව රුපියල් 21,000ක වේතනයක් ගෙවීමට කටයුතු කළ යුතු ය. තව ද, මෙම රුපියල් 21,000ක වේතනය සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් සහ පාරිතෝෂික මුදල් ගෙවීමේ දී පදනම් කර ගැනීමට සේවායෝජකයන් කටයුතු කළ යුතු බව දන්වා සිටිමි.

ආර්.පී.ඒ.විමලවීර

ලේකම්

ආර් පී ඒ විමලවීර
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
7 වන මහල, "මෙහෙවර පියෙස"
නාරාහේන්පිට, කොළඹ 05.

ලේකම්/செயலாளர்/Secretary : -94 112 368164 කාර්යාලය/அலுவலகம்/Office : +94 112 581991 ෆැක්ස්/தொலைநகல்/Fax : +94 112 582938/+94 112 368165
විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : slmol@slt.lk / slmol @labourmin.gov.lk වෙබ් අඩවිය/இணையத் தளம்/Web site: www.labourmin.gov.lk